www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ධනවාදයේ ලෝක අර්බුදය හා සමාජවාදය සඳහා ඉදිරි දැක්ම

## පලමු වන කොටස

## The world crisis of capitalism and the prospects for socialism
## Part one

**නික් බීම්ස් විසිනි**
**2008 ජනවාරි 31**

*පහත පලවන්නේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ විසින් ජනවාරි 21 සිට 25 දක්වා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර දී පවත්වන ලද ජාත්‍යන්තර පාසැලට ඉදිරිපත් කැරුනු ආරම්භක වාර්තාවේ පලමු වන කොටසයි. මෙම වාර්තාව ඉදිරිපත් කල නික් බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙක් ද ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ද වේ.*

මීට දස වසරකට පෙර, ලෝක සමාජවාදී වෙබ් අඩවිය දියත් කිරීමට ආසන්නව තිබිය දී අප පැවැත්වූ පාසැලේ දී, ඊට පෙර ජූලි මාසයේ පුපුරා ගිය ඊනියා ආසියානු මූල්‍ය අර්බුදයේ ඇඟවුම් විමසා බැලීමට අපි යම් කාලයක් ගත කලෙමු.

අප කුරුමානම් අල්ලමින් සිටින්නේ සෙලවෙන ඉලක්කයකට බැවින්, මෙය තරමක අමාරු වැඩක් බව අර්බුදය පිලිබඳව වාර්තාවක් ඉදිරිපත් කරමින් මම කියා සිටියෙමි. නිසැකව ම, ඇමරිකානු හා ලෝක ධනවාදයේ ගැඹුරු වන්නාවූ අර්බුදයම වන්නා වූ යමක මධ්‍යයේ දී මට හැඟීයන්නේ කලින් ද වින්දා වූ අත්දැකීමක් යලි හමුවී ඇති සෙයකි.

ආසියානු අර්බුදය පුපුරා ගිය විට එය හුදෙක් ආසියානු අර්බුදයක් නොව ලෝක ධනවාදයේ ම අර්බුදය ආසියාව තුල ප්‍රකාශයට පත්වීමක් ලෙස අපි පැහැදිලි කලෙමු. අප අද පොරබදමින් සිටින්නේ හුදෙක් ඇමරිකානු ධනවාදයේ අර්බුදය සමඟ නොව එක්සත් ජනපදය තුල පුපුරා ගිය ලෝක අර්බුදයක් සමග ය.

ප්‍රධාන ආයෝජන සමාගම්වල අලාභ පිලිබඳ අලුත් තොරතුරු දිනපතා ලැබේ; - මෙරිල් ලින්ච් (එනම් ආයෝජන බැංකුව) මේ වනවිට ඩොලර් බිලියන 16.7 ක වටිනාකම් කපා හැරීමකට පාත්‍ර වී තිබේ. - ඉදිරියේ දී තවත් බොහෝ මෙවන් සිද්ධීන් ඇති විය හැකි බවට අනතුරු හැඟවීම් පවතී. විශාල ම ඇමරිකානු බැංකුව වන සිටිගෲප් ඩොලර් බිලියන 18 ක (සබ් ප්‍රයිම්) අවමුඛ උකස්කර ආයෝජන කපා හැරීමෙන් පසුව 2007 වසරේ අවසාන කාර්තුවෙහි, බිලියන 9.83 ක අලාභයක් ලැබූ බව මේ දැන් නිවේදනය කලේය. ඒ වනාහී බැංකුවේ 196 වසරක ඉතිහාසය තුල ලත් ලොකුම පාඩුවයි.

ප්‍රමුඛ ආයෝජන සමාගම් කොතැනින් හෝ විශාල වශයෙන් මුදල් එන්නත් කරවා ගැනීම සඳහා පොරකමින් සිටිති. මෙරිල් ලින්ච් හා සිටිගෲප් යන සමාගම් පමනක් සිංගප්පූරුවෙන් හා සවුදි අරාබියෙන් ඩොලර් බිලියන 21 අරමුදල් ලබාගැනීමට වෑයම් කරමින් සිටිති.

සෑම දිනක ම අර්බුදය පිලිබඳ අලුත් නිවේදන නිකුත් කෙරේ. ඉකොනොමිස්ට් සඟරාව ජනවාරි 18 දින බැඳුම්කර රක්ෂන වෙලඳපොලෙහි වර්ධනය වන අර්බුදය වාර්තා කලේ සියල්ල කඩා වැටේ ද? යන ශීර්ෂයෙනි.

"ඇමරිකාවේ විශාල බැඳුම්කර රක්ෂක සමාගම්, ඩොලර් ට්‍රිලියන 2.4 ක පමන රාජ්‍ය හා පෞද්ගලික බැඳුම්කර රක්ෂනය කර ඇතත් ඔවුන් එම ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍යයෙන් යෙදෙන්නේ බොහෝ දුරට බාහිර අවධානයක් නොලබා ය. එහෙත් දැන් ඒවායේ පයපැකිලීම හේතු කොට ගෙන පැහැදිලිව ම ඒවා අවධානයට ලක් වීමට පටන් ගෙන ඇත. ඉන් එකක් හෝ කිහිපයක් ඇද වැටුනොත්, ඒවායේ ආවරනසහතික මත රැඳී සිටින බැංකු හා අනෙකුත් මූල්‍යායතන එක පිට එක වැටෙන ක්‍රියාවලියකට භාජන වනු ඇත. අනෙක් අතට මෙය නය අර්බුදය තවත් උග්‍ර කරමින් ඇමරිකානු ආර්ථිකයේ තියුනු බාලවීමක් සමඟ දැනට මත් පොර බදමින් සිටින ප්‍රතිපත්ති සම්පාදකයන්ට තවත් ලොකු හිසරදයක් වනු ඇත."

"මූල්‍ය සංස්ථා එකක් අනෙක මත වැටී දාම වශයෙන් බිඳවැටීමේ එවන් තර්ජනයක් බරපතලව ඉස්මතු වී පවතී. එම්බීඅයිඒ හා ඇම්බැක් යන විශාලතම බැඳුම්කර රක්ෂන ආයතන දෙකට මෙතෙක් ලබා දී ඇති ඒඒඒ මට්ටමේ නය යෝග්‍යතා අගැයීම් ලඟදී ම පහත හෙලීමට සිදුවිය හැකි බවට නය යෝග්‍යයතා අගයන ආයතනයක් වන මූඩීස්, ඉඟි කර ඇත."

ඇම්බැක් රක්ෂන සමාගම, තම කොටස් අගය බිලියන 3.5 කින් පහත හෙලන බවත් සිය ප්‍රධාන විධායකයා අස් කරන බවත් ජනවාරි 16 වන දින නිවේදනය කලහ. ඉකොනොමිස්ට් සඟරාව ජේපී මෝර්ගන් චේස් බැංකු ප්‍රධානියා වූ ජේමී ඩිමොන්ගෙන් උපුටා දැක්වූ පරිදි බැඳුම්කර රක්ෂන හිමියන්ගේ අර්බුදය නය වෙලඳපොලවලට "බෙහෙවින් බිහිසුනු" ප්‍රතිපල ගෙන ආ හැකිය. ඉකොනොමිස්ට් සඟරාව මෙසේ කියා සිටියේ ය. "ලොකු රක්ෂන කරුවා ඇදවැටුනොත් පමනක් යයි ඉහත සඳහන් කතාව අවතක්සේරුවක් සේ පෙනී යා හැකිය."

දැන් බොහෝ අර්ථශාස්ත්‍රඥයෝ ආර්ථික පසුබෑමක් ගැන කතා කරති. සාකþච්ඡාව යොමු වී ඇත්තේ එවැන්නක් කෙතරම් ඉක්මනින් ලඟාවනු ඇත්ද හා කොතෙක් කල් පවතී ද යන්න වටාය.

ෆෙඩරල් රිසර්ව් බැංකු සභාපති බෙන් බර්නන්කේ ජනවාරි 10 දින එක්සත් ජනපද ආර්ථිකය පිලිබඳව කල ප්‍රධාන කථාව තුල, බැංකුවේ විවෘත වෙලඳපොල කමිටුව මීලඟට මාසය අන්තිමේදී රැස්වූ කල පොලී අනුපාතය තවදුරටත් පහත හෙලන බවට නොකියා කීවේය. එහෙත් මෙම ප්‍රවෘත්තිය මූල්‍ය වෙලඳපොලවල නැඟීමක් ඇති නොකලේය. ඒ වෙනුවට සිදුවූයේ ඩව් ජෝන්ස් දර්ශකය ඒකක 250 න් පහල වැටීම ය.

පුදුමයක් නොවේ. බර්නන්කේ, නිවාස ඉදිකිරීම් හා නව නිවාස අලෙවිය කලින් පැවති ඉහල මට්ටමේ සිට සියයට 50 න් පමන පහත වැටීම පෙන්වා දෙමින් මෙසේ පැවසීය. "(පවත්නා) දහනශීලී තත්වය සාමාන්‍යයෙන් සිදුවනවාටත් වඩා ආර්ථිකයේ ගමන් මඟ පිලිබඳව අනාවැකි පලකිරීම අපහසු කොට තිබේ. අවමුඛ (සබ් ප්‍රයිම්) උකස්කරයන් ගෙන් ඔබ්බට නොව මූල්‍ය වත්කම්වල පුලුල් ක්ෂේත්‍රයක් පිලිබඳව ද නියමිත අගයන් තීන්දුකර ගැනීමේදී ආයෝජකයන්ගේ සැලකිය යුතු අවිනිශ්චිත භාවයක් (1) පවතියි. ලැබෙන තොරතුරුවල නිගමනය නම් 2008 සැබෑ ක්‍රියාකාරිත්වයෙහි පදනම් රේඛාව පිලිබඳ දැක්ම නරක අතට හැරී ඇතුවාක් මෙන් ම වර්ධනය පහත වැටීමට පවත්නා වඩාත් අවදානම් කැපී පෙනෙන ගතියක් පැනනැග ඇති බවය." සමහර ක්ෂේත්‍රවල වර්ධනයක් දක්නට ලැබුන ද "මූල්‍ය තත්වය අඩමානව පවතියි."

මූල්‍ය තත්වය කොතරම් බිඳෙනසුලු ද යන්න පසුගිය මාස කිහිපයේ මූල්‍ය මාධ්‍යවල පලවූ ප්‍රකාශයන්ගෙන් දැකගත හැකිය.

දෙසැම්බර් 19 දින ඉකොනොමිස්ට් සඟරාව ද්‍රවශීලතාවය හීනවීයාමෙන් ඔබ්බට ගොස් ඇති අර්බුදය "බැංකු අර්බුදයක් බවට පත්වීමට ද ඉඩ ඇති බව දැන් පෙනී යන්නේය" යි. කියා සිටියේ ය. පසුගිය නොවැම්බරයේ දී "බඩ දඟලන අවස්ථාව" එලඹුනේ නිවාස වෙලඳපොලේ අලාභවල තරම වටහාගත් විට ය; බැංකු ඒවා බාරගැනීම ප්‍රතික්ෂේප කොට ඒවා පියවාගැනීම සඳහා ප්‍රාග්ධනය වෙන් නොකර හැරි කල්හි ය, "බංකොලොත්වීම්, පසුබෑම, නඩුමගට බැසීම, ආරක්ෂනවාදය, කනගාටුයි නමුත් 2008 දී මේ සියල්ල සිදු විය හැකි දේවල්ය" යනුවෙන් අනතුරු අඟවමිනි.

*ෆිනෑන්ෂල් ටයිම්ස්* හි ආර්ථික ප්‍රකාශක මාර්ටින් වුල්ෆ් දෙසැම්බර් 12 දින ප්‍රකාශයේ මෙසේ ලිවීය. " පලමුව හා සියල්ලටත් වඩා, අද නය වෙලඳපොලවල සිදුවෙමින් තිබෙන දෙයින් ප්‍රකාශිත වන්නේ ගනුදෙනු මුල්කොට ගත් මූල්‍ය ධනවාදයේ ඇංග්ලෝ - සැක්සන් ආකෘතියේ විශ්වසනීයත්වය දැවැන්ත ප්‍රහාරයකට ලක්ව ඇති බවය. නිව්යෝර්ක් හා ලංඩන් මූල්‍ය වෙලඳපොලවල අරටුවෙහි ම දක්නට ඇත්තේ ආවතේව ධනවාදයේ හා පරිපූර්න අසමත්කමේ අච්චාරුවකි."

දෙසැම්බර් 16 දින ඩේවිඩ් ඉග්නේෂස් නම් ලියුම්කරු *වොෂින්ටන් පෝස්ට්* හි මෙසේ ලියා ඇත. "පසුගිය ග්‍රීෂ්මයේ පටන් ගත් නය සිඳීයාම තව මත් ගමන අවසන් කර නැත. අවනතියට පත්ව ඇති මූල්‍ය පද්ධතිය ලෝක ආර්ථිකය ගැඹුරු පසුබෑමකට ඇද දමතැයි මහ බැංකු කරුවෝ බිය පලකරති."

දෙසැම්බර් 16 වන දින ප්‍රකාශයක් තුල *ෆිනෑන්ෂල් ටයිම්ස්* තීරු රචක වුල්ෆ්ගැන්ග් මුන්චාවු ලියා ඇත්තේ අර්බුදය තව මත් පහව ගොස් නැති හෙයින් පෙනීයන්නේ එය හරයෙන්ම ද්‍රවශීලතා අර්බුදයක් නොවන බවය.

"එකක් දේපල ද අනෙක නය ද පදනම් කර ගෙන නැගී ආ අන්තර් සම්බන්ධිත හා යෝධ බුබුලු දෙකක් එකවර පුපුරා යාම නිසා පැනනැගුනු එය වනාහී පරිපූර්න ද්‍රවශීලතා අර්බුදයකි. එය බැංකු හා ආයෝජකයන් බංකොලොත් වීමේ අද්දරට ද, සමහරෙක් සිය ඇඟිලි තුඩුවලින් යාන්තම් එල්ලීගෙන සිටින තැනට ද ගෙන ආවේය. එහෙත් මෙම අදියරේ දී හෝ ද්‍රවශීලතා අර්බුදය තුරන් කිරීමට මහ බැංකු ඉදිරිපත් කරන විසඳුමක් දක්නට ඇත්තේ නැත."

සමහර මූල්‍ය මාධ්‍ය පිම්කෝ වත්කම් කලමනාකරන සාමූහිකයේ ප්‍රධානියා වන බිල් ග්‍රොස් කල ප්‍රකාශයන් උපුටා දැක්වීය. "අප දැක ගනිමින් සිටින්නේ සාරභූත වශයෙන් ම වත්මන් සංකීර්න බැංකු පද්ධතියේ කඩාවැටීම ය; පිම්කෝ යනු කුඩා ව්‍යවසායක් නො වේ. එය ඩොලර් ට්‍රිලියනයක අරමුදල් කලමනාකරනය කරයි. (එය වනාහී අග මුල තෝරා ගැනීමට අපහසු අධි ප්‍රමිත (leverged) නය දීම් සංකීර්නයක් වූ නූතන බැංකු පද්ධතියේ බිඳ වැටීම ය."

අර්බුදයේ මුල් සලකුනු දක්නට ලැබුනේ 2006 වසරේදී එක්සත් ජනපදය තුල නිවාස මිල ගනන් පහතට හැරීම ඇරඹීමත් සමඟ ය. උකස්කරයන් මත

පදනම් වූ මෙවන් මූල්‍ය කටයුතු සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වීම මෙම පහතට හැරීම පුලුල් වශයෙන් එක්සත් ජනපද ආර්ථිකය කෙරේ ද හා එහි මූල්‍ය පද්ධතිය කෙරේ ද යම් කිසි වැදගත්කමක් දරන බවට පෙන්නුම් කලේය.

ෆෙඩරල් බැංකුවේ නිල ස්ථාවරය වූයේ ගැටලු දරාගත හැකිවේ ය යන්න යි. පෙබරවාරි 14 දින එහි සභාපති බෙන් බර්නන්කේ "නිවාස වෙලඳපොල තුල ස්ථායී වීමේ යම් සලකුනු මෑතකදී දක්නට ලැබී ඇති" බව කියා සිටියේ ය. ඉන් පසු මාර්තු 28 දින ඔහු මෙසේ ප්‍රකාශ කලේය. "අවමුඛ නිවාස වෙලඳපොලේ ගැටලු මූල්‍ය වෙලඳපොලවලට හා පුලුල් වශයෙන් ආර්ථිකය කෙරෙහි ඇති කල බලපෑම් දරාගත හැකි බවක් පෙනීයයි."

මාර්තු 17 දින ඔහු මෙසේ කීවේය: "අවමුඛ ක්ෂේත්‍රයේ ගැටලු පුලුල් නිවාස වෙලඳපොල කෙරෙහි ඇති කල බලපෑම සීමිත වනු ඇත. එය ආර්ථිකයේ අනෙකුත් අංශ වෙත හෝ මූල්‍ය ක්‍රමය තුලට උතුරා යාමේ සැලකිය යුතු අන්තරායක් ඇති නොකරනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු." නය හීනවීයාමෙන් පහර වැදීමට ටික කලකට පෙර, ජූනි 5 දින ඔහු මෙසේ කීවේ ය. "ආදායමේ තිරසාර වර්ධනය ද සාපේක්ෂව අඩු උකස් අනුපාතයන් ද ඇතුලත් ප්‍රාථමික සාධක අවසානයේ දී නිවාස ඉල්ලුමට ආධාරක වනු ඇත. එමෙන්ම මෙම අවස්ථාවේ දී අවමුඛ අංශයේ ගැටලු පුලුල් ආර්ථිකය හෝ මූල්‍ය ක්‍රමය තුලට උතුරා යාමේ බැරෑරුම් අනතුරක් දක්නට නැත."

මෙම ප්‍රකාශයන් තත්වය කෙතරම් දුරට අව තක්සේරු කලේද යන්න වැඩිකල් නොයාම පැහැදිලි විය. ජූනි මැද වන විට, බෙයාර් ස්ටියර්න්ස් ආයෝජන බැංකුව තමන් පිහිටුවා ඇති රක්ෂන අරමුදල් දෙක අවමුඛ නය උකස්කරයන්හි ආයෝජනයන් කිරීම නිසා ගැටලුවලට මුහුනපා ඇති බව ප්‍රකාශ කිරීමත් සමඟ, අවමුඛ අර්බුදය ඉස්මත්තට ආවේ ය.

ඊලඟ මාස දෙක තුල, ප්‍රධාන බැංකු හා මූල්‍ය ආයතන අවදානම් මූල්‍ය ගනුදෙනුවල පැටලී ඇති තරම පිලිබඳ කනස්සල්ල වැඩිවෙත්ම අර්බුදය වේගයෙන් දරනහරින්නට පටන් ගති. අගෝස්තු 17 දින, එක්සත් ජනපදයේ ෆෙඩරල් රිසර්ව් බැංකුව පලමු ප්‍රධාන මැදිහත්වීම කලේ බැංකුවලින් අය කරන වට්ටම් අනුපාතිකය පහත දැමීම නිවේදනය කරමිනි. ඉන් පසු බිඳවැටීමක් වලක්වා ගැනීමට මූල්‍ය අධිකාරීන් විසින් දෙවරක් සිදු කල මූලික මැදිහත්වීම් අතරතුරේ වෝල් වීදිය තියුනු හැල හැප්පීම්වලට මුහුන පෑවේය. ෆෙඩරල් බැංකුව මැදිහත් නොවූයේ නම් පසුදිනයේ දී මූල්‍ය වෙලඳපොලෙහි ඒකක 1000 කඩා වැටීමක් සිදුවිය හැකිව තිබුනු බව පැහැදිලි විය.

සැප්තැම්බර් 18 දින ෆෙඩරල් බැංකුව යලි මැදිහත් වෙමින් ෆෙඩරල් අරමුදල් රේට්ටුව පදනම් ඒකක 50 කින් පහත හෙලීය. මෙය වෙලඳපොලවලට යම් සහනයක් ගෙනදුන් නමුදු නොවැම්බර් වනවිට පැහැදිලි වූයේ අර්බුදය කිසි සේත් අවසන්වී නැති බවය. මූලික ගැටලුව වූයේ ගෝලීය ධනේශ්වර පද්ධතියේ මූලික නය ගනුදෙනු කෙරෙහි විශ්වාසය පලුදුවී යාමයි. ප්‍රධාන බැංකු හා මූල්‍යායතන නය දීම් අත්හිටවූයේ එක්කෝ ශේෂ පත්‍රයට පිට තමන්ගේ ම ගනුදෙනු යම් හෙයකින් අසාර්ථක වුවහොත් ඒ සඳහා මුදල් ලඟ තබාගැනීම නිසා ය; නැතහොත් තමන් නය දීමට බලාපොරොත්තු වන බැංකු හෝ වෙනත් ආයතන සැක කටයුතු නය ගනුදෙනුවලට කොතෙක් දුරට නිරාවරනය වී ඇත්දැයි දැන නොසිටීම නිසාය.

මෙම තිගැස්ම ලිබෝර් අනුපාතය (ලංඩන් අන්තර් බැංකු පිරිනැමුම් අනුපාතය) ලෙස හඳුන්වන, එක් බැංකුවක් තවත් බැංකුවකට සුරක්ෂිත නොවන නය සඳහා පිරිනමන වට්ටම් පොලී අනුපාතයේ හැසිරීම තුලින් ප්‍රකාශයට පත්විය. ආයෝජනයේ සුරක්ෂිතම ක්‍රමය ලෙස සැලකෙන එක්සත් ජනපද භාන්ඩාගාර පොලී අනුපාතයට වඩා සාමාන්‍ය කාලයකදී ලිබෝර් අනුපාතය ඉහල ආන්තික අගයක් ගනී. එහෙත් අවමුඛ අර්බුදය පැන නැඟීමත් ප්‍රධාන බැංකුවල නය කපාහැරීම් වැඩිවීමත් සමඟ ලිබෝර් රේට්ටුව තියුනු ලෙස ඉහලනැඟුනි.

ප්‍රධාන බැංකු - මූල්‍ය ලෝකයේ ප්‍රමුඛ නාමයන් හා ආයතන - එකිනෙකා කෙරෙහි තබන විශ්වාසයේ හීනවීමක් ලිබෝර් රේට්ටුවේ ඉහල නැඟීමෙන් සලකුනු කරයි. අනෙක් මූල්‍යායතන සම්බන්ධයෙන් ගත්විට මෙම විශ්වාසය හංගවීම තවත් වැඩිය. ඔවුන් අත්දුටුවේ, එක් අවධියකදී තමන්ට ලැබිය හැකි වූ ද සිය කටයුතු පදනම්ව තිබුනා වූ ද පහසු මුදල් සැපයුම තවදුරටත් නොපවතින බවය.

එංගලන්තයේ නොදර්න් රොක් බැංකුවේ අවසානයට තුඩුදුන්නේ මෙයයි. එය බංකොලොත් වූයේ එක්සත් ජනපද අවමුඛ උකස්කරයන්හි ආයෝජනය කර තිබීම නිසා නොවේ. එම ක්ෂේත්‍රයෙහි ඔවුන්ගේ සම්බන්ධය නොතැකිය යුතු තරම් ය. ඒ වෙනුවට බැංකුව, අවමුඛ අර්බුදයෙන් මුදාහල නය අර්බුදයේ ගොදුරක් බවට පත්විය. නොදර්න් රොක් සිය මුදල් ඉපයූවේ කෙටිකාලීන මුදල් වෙලඳපොලෙන් විශාල ලෙස නයට ගැනීමෙන් හා ඉන් පසුව එම මුදල් අනෙකුත් මූල්‍යායතන මඟින් පිරිනමනවාට වඩා තරමක් අඩු පොලියකට දිගුකාලීන නය දීම සඳහා යෙදවීම මඟින් ය. පටු ලාභානුපාතයක් මත ක්‍රියාත්මක වීමේදී ඔවුන්ට විශාල ප්‍රමානයක් මුදල් නයට ගැනීමට සිදුවිය. කෙටිකාලීන නය දිගට ම ලැබිය හැකිවූ තාක් දුරට මෙම ක්‍රමය හොඳින් ක්‍රියාත්මක විය. එහෙත් එසේ නොහැකිවූ විට බැංකුව බිඳ වැටුනි.

සෙන්ට්‍රෝ නම් ඕස්ට්‍රේලියානු දේපල සාමූහිකය බිඳ වැටුනේ ද මේ ක්‍රියාවලියේ ම ප්‍රතිපලය වශයෙනි. පසුගිය දශකය තුල ඔවුහු ආයෝජකයන් සඳහා වාර්ෂිකව සියයට 20 වැඩි ප්‍රතිලාභ අත්කර දුන්හ. ඉහල නගින වෙලඳපොලකදී මිලට ගන්නා සාප්පු සංකීර්න කොටස් වශයෙන් කලමනාකරන අරමුදල්වලට විකිනීමේ මූලෝපායක ඔවුහු යෙදී සිටියහ. එක්සත් ජනපදය තුල පසුගිය මැයි මාසයේදී කල ඩොලර් බිලියන 6.3 ක ගනුදෙනුව ඔවුන් කල ලොකුම ගනුදෙනුව යි. ගනුදෙනුවේ කොටසක් සඳහා ඔවුන් යෙදවූයේ කෙටිකාලීන නයකි. දෙසැම්බර් 17 ඔවුන් නිවේදනය කලේ බිලියන 2.5 ක් වටිනා කෙටිකාලීන නය ගෙවීමට නොහැකි බවයි. සෙන්ට්‍රෝ සභාපතිට අනුව "අපට මෙන්ම අනෙකුත් සමාගම්වලටත් ඓතිහාසිකව ලැබිය හැකිව තිබූ අරමුදල්වල මූලයන් ව්‍යාපාරික කටයුතු සඳහා වැසීයන බවක් අපි සිහිනෙන්වත් බලාපොරොත්තු නොවීමු. එමෙන්ම එවැන්නක හැකියාව සාධාරන ලෙස සංකල්පනය කලේවත් නැත."

අතීතයේදී නොයෙක් විට සිදුවූ ආකාරයට, මූල්‍ය පහර දී ඇත්තේ හරියට ම අර්බුදය ලෝක ආර්ථිකය ප්‍රධාන පෙලේ ඉහල නැගීමක් අත් විඳිමින් සිටින අවස්ථාවේදී ම ය.

පසුගිය මැයි මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ *ලෝක ආර්ථික දැක්ම* (ලෝආද) තුල, 2003-06 අතර කාලයේ ලෝක ආර්ථික වර්ධන අනුපාතයේ සාමාන්‍ය සියයට 4.9 ක් වූ බව සඳහන් කරමින් අඩු තරමින් ඉදිරි දෙවසරෙහි එය අඛන්ඩව පවතිනු ඇතැයි අනාවැකි පල කලේය. ලෝක වර්ධන අනුපාතය සියයට 5.4 ක්වූ 1970-73, වඩා බලවත් එකම කාල පරිච්ඡෙදය එය විය. වත්මන් අනුපාතය තිරසාරව පැවතිය හොත් එය පෙන්නුම් කරනු ඇත්තේ 1970 න් පසු ලෝක ආර්ථිකයේ වඩාත්ම බලගතු ප්‍රසාරනයේ සය වසර එය ලෙසය.

2006 දෙසැම්බරයේදී ලෝක බැංකුව විසින් පලකල '*ගෝලීය ආර්ථික දැක්ම*' නම් වාර්තාව අවශ්‍යයෙන්ම මීට වඩා වෙනස් නොවීය. "දියුනු ආර්ථිකයන් මෙන් දෙගුනයකට වැඩි වේගයකින් වර්ධනය වූ සංවර්ධනය වෙමින් පවතින රටවල, ඉතා වේගවත් ප්‍රසාරනයක්" පෙන්නුම් කරන "බලගතු ක්‍රියා කලාපයක්" ගැන එය සඳහන් කරයි. මෙය හුදෙක් සියයට 10.4 න් වර්ධනයවූ චීන ආර්ථිකයේ බලපෑමෙහි ප්‍රතිපලයක් නොවූ අතර දියුනු වෙමින් පවතින රටවල් සමූහයක් හරහා විහිදී ගිය එකකි. එකට ගත්විට මෙම කලාපයන් ගෝලීය නිමැවුමේ වර්ධනයෙන් සියයට 38 කට දායක වන අතර එය ලෝක දල දේශීය නිෂ්පාදනයේ තම පංගුව වන සියයට 22 ට වඩා සැහෙන ඉහල මට්ටමකි. පසුගිය 25 වසර 1980 - 2000 හා 2000 - 2005 වශයෙන් අවධි දෙකකට වෙන්කල හොත් දියුනුවන රටවල සාමාන්‍ය වර්ධනය ප්‍රථම අවධියේදී සියයට 3.2 ක සිට දෙවැන්නේදී සියයට 5 ක් දක්වා ඉහල නැග තිබෙන බව ලෝක බැංකු වාර්තාව සඳහන් කරයි. එය හුදෙක් චීනයේ හා ඉන්දියාවේ ඉහල නැගි වර්ධනයේ ප්‍රතිපලය නොවනවාක් මෙන්ම සියලු රටවල දායකත්වයේ ප්‍රතිපලයක් ද නොවේ.

ජාමූඅ ලෝක ආර්ථික දැක්ම වාර්තාව ද ආර්ථික ජයග්‍රහන පිලිබඳ එවන් කථාන්තරවලින් පිරී පවතියි. බටහිර යුරෝපයේ ආර්ථික ක්‍රියාකාරිත්වය ද "ජවයක් ගෙන" තිබේ. යුරෝ කලාපයේ දල දේශීය නිෂ්පාදිතයේ (දදේනි) වර්ධනය සියයට 2.6 කට ලඟාවී ඇති අතර එය 2005 අනුපාතයෙහි දෙගුනයකට ආසන්නවේ. එය 2000 ට පසු ඉහල ම අගයයි. "ඉමහත් අපනයන වර්ධනයත් මෑත වසරවල අත් කර ගත් තරගකාරිත්වයේ හා ව්‍යාපාරික සෞඛ්‍යයේ මූලික ප්‍රගතිය මඟින් ජනනය කල ආයෝජනයේ ශක්තියෙන් දල්වන ලද ජර්මනිය එහි ප්‍රධාන යාන්ත්‍රනය විය." වසර 15 කට පසු අවම මට්ටම සලකුනු කල යුරෝ කලාපයේ සමස්ත විරැකියා අනුපාතය සියයට 7.6 දක්වා පහල වැටුනි.

1990 ගනන් මුල දී කොටස් වෙලඳපොලේ හා දේපල බුබුලෙහි කඩාවැටීමෙන් පසුව දශකයකට වැඩි කාලයක් තිස්සේ බොහෝකොට ම එක තැන පල්වූ ආර්ථිකය සහිත ජපානයෙන් පවා ලැබුනේ සුබ ආරංචිය. 2006 මැද පාරිභෝජනයේ අනපේක්ෂිත වැටීමක් තිබිය දී පවා "ආර්ථිකයේ ඉහල ලාභ, වැඩිදියුනුවූ ව්‍යාපාරික ශේෂ පත්‍ර හා බැංකු නය දීම් යලි ඇරඹීම මඟින් තල්ලුව සැපයූ පෞද්ගලික අයෝජනයේ ප්‍රසාරනය හා ඉහල යන අපනයන වර්ධනය හමුවේ ආර්ථිකයේ පතුලෙහි ජවය දැඩිව පැවතුනි." ජපානයේ සැබෑ ආර්ථික වර්ධනය සියයට 2 කට වඩා ඉහලින් පවතිනු ඇතැයි බලාපොරොත්තුවේ. ලතින් ඇමරිකාවේ වර්ධන අනුපාතිකය 2006 දී සියයට 5.5 සිට 2007 දී සියයට 4.9 දක්වා අඩුවෙතැයි බලාපොරොත්තු වුවත් එය "1970 පටන් ලතින් ඇමරිකානු වර්ධනයේ බලවත්ම තෙවසරක කාලයයි."

ඊනියා "නැගී එන ආසියාවේ" ආර්ථික ක්‍රියාකාරිත්වය "චීනයේ හා ඉන්දියාවේ ඉතා බලවත් වර්ධනයෙන් ජවය ලැබ ප්‍රසාරනය කඩිනම් පියවරින් දිගට ම පවත්වා ගනු ඇත." වැඩිවූ පාරිභෝජනය, ආයෝජනය හා අපනයනයේ ප්‍රතිපලය ලෙස 2006 දී චීනයේ සැබෑ දදේනි සියයට 10.7 න් ප්‍රසාරනය වූ අතර ඉන්දියාවේ වර්ධන අනුපාතය සියයට 9.2 ක් විය.

රුසියාවේ වර්ධන අනුපාතය 2006 දී සියයට 7.7 සිට 2007 දී මඳක් අඩුවී සියයට 7ක් හා 2008 දී සියයට 6.2 ක් වේය යි අපේක්ෂිතය. නැගෙනහිර

යුරෝපය තුල වර්ධනය 2006 දී සියයට 6.4 ක් දක්වා වැඩිවනු ඇත.

බලවත් ගෝලීය වර්ධනයත්, වැඩි වූ ප්‍රාග්ධන ගලා ඒමත්, රටවල් ගනනාවක තෙල් නිෂ්පාදනයේ වැඩිවීමත් ඉන්ධන නොවන භාන්ඩ සඳහා ඉල්ලුමේ ඉහලයෑමත් හමුවේ අප්‍රිකාවේ ආර්ථික දසුන "ඉතා ශුභදායක" බව ලෝක ආර්ථික දැක්ම වාර්තාව පෙන්වා දෙයි. "සැබෑ දදේනි වර්ධනය 2008 දී සියයට 5.8 දක්වා අඩුවීමට පෙර, 2005 දී තිබුනු 5.5 සිට මෙම වසර (2007) තුල සියයට 6.2 දක්වා වැඩිවේ යයි අපේක්ෂිත ය."

පසුගිය ජූනි මාසයේ පලවූ ජාත්‍යන්තර සමථ බැංකුවේ වාර්තාවකින් පෙන්වා ඇත්තේ 2006 ලෝක නිමැවුමෙහි ඓක්‍ය, වර්ධනය අඛන්ඩව සියයට 4 කට ඉහලින් තිබූ සිවුවන වසර සටහන් කරමින් සියයට 5.5 අනුපාතයකින් ප්‍රසාරනය වූ බවය. 2006 දී සෑම දියුනු කාර්මික රටක්ම පාහේ ඉහත ප්‍රවනතාව අනුව යමින් වර්ධනයක් හා සියලු ප්‍රධාන නැගී එන වෙලඳපොලක් ම ප්‍රගතියක් අත් කර ගැනීම මත ආර්ථික ශක්තිය වඩාත් පුලුල් ලෙස පදනම් කෙරේ.

ඉහත ප්‍රවනතාව අනුව යමින් 1994-97 ද ගෝලීය ආර්ථික වර්ධනය අඛන්ඩව සිදුවූ සිවුවන වසරක් සටහන් කල ද, එය අංශ ගනනාවකින් පසුගිය සිවු වසරේ ඉහල නැගීමට වඩා වෙනස් වේ. පලමුව, විශේෂයෙන් ම ආසියාවේ, නැගී එන වෙලඳපොල ආර්ථිකයන්, දශකයකට පෙර ඔවුන් ගෝලීය වර්ධනයට දායක වූවාට වඩා සියයට 1.5 එක් කර තිබේ. සැලකිය යුතු දුරකට මෙය පෙන්නුම් කරන්නේ චීන ආර්ථිකයේ උද්‍යෝගයයි.

2007 ඔක්තෝබරයේ පලකල ජාමූඅ සමීක්ෂන සඟරාවක්, චීන හා ඉන්දීය ආර්ථික වර්ධනය කොතෙක් වැදගත් වී ඇත්දැයි පැහැදිලි කර තිබේ. පහත පලවන ප්‍රස්ථාරවලින් ඇඟවුම් කරන ආකාරයට දැන් ලෝක ආර්ථික වර්ධනයේ වැදගත්ම තනි දායකයා චීනයයි.

## 1 වන ප්‍රස්ථාරය

## නව ගාමක බලය

**ප්‍රධාන නැගීඑන වෙලඳපොලවල් ලෝක වර්ධනයේ ප්‍රධාන එංජිම බවට පත්ව තිබේ. ප්‍රථම වතාවට චීනය හා ඉන්දියාව රටවල් මට්ටමින් ගෝලීය වර්ධනයට විශාලතම දායකත්වය සපයයි.**

**(ලෝක වර්ධනයේ ප්‍රතිශතය, පීපීපී බර තැබීම මත පදනම්ව)**




මූලාශ්‍රය-ජාමූඅ කාර්ය මන්ඩල ගනන් බැලීම්,

( පීපීපී හුවමාරු දර්ශකය අර්ථ දක්වන්නේ සෑම රටේම භාන්ඩ හා සේවා එකම ප්‍රමානයක් මිලට ගතහැකිවන පරිදි එක් රටක මුදල තවත් රටක මුදලකට පරිවර්තනය කිරීමේ අනුපාතිකය ලෙසය. පීපීපී හුවමාරු අනුපාතිකය යොදාගැනීමෙන් ගෝලීය වර්ධන සමස්තය තුල නැගීඑන වෙලඳපොල ආර්ථිකයන්ට වැඩි බරක් පැටවේ.

## 2 වන ප්‍රස්ථාරය

## සිය වගකීම් ඉටු කිරීම

**වෙලඳපොල මිලගනන් අනුව ලෝක වර්ධනයට ලොකු ම දායකත්වය සපයන්නේ ද චීනයයි.**

**ලෝක වර්ධනයේ ප්‍රතිශතය- වෙලඳපොල දදේනි මත බර තැබේ**




මූලාශ්‍රය-ජාමූඅ කාර්ය මන්ඩල ගනන් බැලීම්

පහත දැක්වෙන මවිත කරන සුලු සංඛ්‍යා ලේඛනයෙන් ද චීන ආර්ථික වර්ධනයේ පරිමාව

කැටිකොට දක්වයි. 2007 දී චීනය සතුවූ වානේ කම්හල් 7000, 2002 තිබූ සංඛ්‍යාව මෙන් දෙගුනයකි.

මූල්‍ය ආයතනද සුබවාදී විය. 2002 අප්‍රේල් මාසයේදී ඩොයිෂ් බංකු සමීක්ෂනයක් පෙන්වා දුන්නේ, 1970 ගනන්වලින් පසුව ලෝක ආර්ථිකය උද්ධමනයේ වැඩිවීමකින් තොරව එහි වර්ධනයේ දිග ම කාලවකවානුව ගතකරමින් සිටින බවයි. 1999-2000 නව ආර්ථිකය 1.0 තුල, කොටස් වෙලඳපොල හා ඩොට්කොම් බුබුල බිඳවැටීම ද එක්සත් ජනපදය තුල පසුබෑමක් වැඩීයාම වැනි දුෂ්කරතාවන් පැවතියේ වී නමුත් "නව ආර්ථිකය 2.0 දී ඒවා ජය ගෙන ඇති බවක් පෙනීයයි."

අද දිනයේදීත් ලෝක ආර්ථිකය සමස්තයක් ලෙස වර්ධනය වනු ඇතැයි අනාවැකි පලවේ. පසුගිය මාසයේදී නිකුත් කල වාර්තාවකින් ලෝක බැංකුව අනාවැකි පලකලේ, "සංවර්ධනය වන රටවල ඉමහත් ප්‍රසාරනය, ඉහල ආදායම් ලබන රටවල දුබල ප්‍රතිපල පාර්ශවීය ලෙස ඌනපූරනය කරන අතර" 2008 ගෝලීය වර්ධනය සියයට 3.3 ක් වනු ඇති බවට ය.

කෙසේ වුවද, මූලික ප්‍රශ්නය එක්සත් ජනපදය හා සමස්තයක් ලෙස ලෝක ආර්ථිකය පසුබෑමකට ගමන්කරන්නේ ද යන්න නොව, මෙම අර්බුදයට තුඩුදුන් ක්‍රියාවලීන් හා ඒවායේ ඇඟවුම් කවරේ ද යන්නය.

නිසැකව ම වෙනත් තැන්වල ද අනුකරනය කරනු ඇති, ලෝක බැංකුවේ නවතම පෙරදැකීම් අංගලක්ෂනය කෙරෙන එක් අතකින් - තවත් අතකින් යන ප්‍රවිෂ්ටය ප්‍රතික්ෂේප කිරීම අවශ්‍යය.

## මතු සම්බන්ධයි

© www.wsws.org